# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1948/16 - 2016 ජනවාරි මස 06 වැනි බදාදා - 2016.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාට පැවරෙන විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 2015 නොවැම්බර් මස 30 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2015 නොවැම්බර් මස 12 දින,
කොළඹ දී ය.

උපලේඛනය

(1) කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍ය

| *1 වැනි තීරුව* | *2 වැනි තීරුව* | *3 වැනි තීරුව* |
|---|---|---|
| කාර්යයන් හා කර්තව්‍යයන් | දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | ක්‍රියාත්මක කළ යුතු නීති |
| 1. අමාත්‍යාංශය යටතේ ඇති සියළුම කර්මාන්තපුර අධීක්ෂණය හා ඒ ඒ කර්මාන්තපුරවල කර්මාන්තකරුවන් සම්බන්ධීකරණය කොට ගෙන කර්මාන්ත වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු | | කාර්මික ප්‍රවර්ධන පනත 46/1990 |
| 2. අළුතින් කර්මාන්තපුර ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රදේශ හඳුනාගෙන ඒ සම්බන්ධ නිර්දේශ හා තොරතුරු ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරමින් කර්මාන්තපුර අළුතින් ඇති කිරීම | | |
| 3. කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රගමණය සඳහා නව තාක්ෂණ යොදා ගැනීම පිළිබඳව සොයා බැලීම හා ඒ සම්බන්ධව අමාත්‍යාංශයට මග පෙන්වීම | | |
| 4. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පිහිටුවා ඇති සියළුම කර්මාන්තපුර පිළිබඳ අධීක්ෂණය හා අවශ්‍ය මඟ පෙන්වීම | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | කාර්මික සංවර්ධන පනත 36/1969 |

01 - 764